*Studies of Education Science: Educational Philosophy*
*Vol. V - Issue I / 2023 / ISSN 2820-2023*


# දර්ශනය පිළිබඳ සාකල්‍යාත්මක ප්‍රවේශයක්

**සමන්ත ඉලංගකෝන්**

## හැඳින්වීම

දර්ශනය මූලාරම්භයේ සිට ම ප්‍රඥාවට ලැදි සුවිශේෂී දැනුම් පද්ධතියක් ලෙස සත්භාවවේදය, ඥාන විභාගාත්මක න්‍යාය, සදාචාරය, චින්තනයේ ස්වභාවය, සුන්දරත්වයේ ස්වභාවය සහ ජීවිතයේ ස්වභාවය සම්බන්ධ විවිධ තේමා ඇතුළත් විෂයයක් ලෙස ක්‍රියාත්මක වේ. දර්ශනය මේ අනුව පැවැත්ම, දැනුම, වටිනාකම්, තර්කනය, මනස සහ භාෂාව සම්බන්ධයෙන් වන ක්ෂේත්‍රවල මූලික ප්‍රශ්න ගවේෂණය කරයි. නූතන යුගයේ මානවීය විමර්ශනය හා සම්බන්ධ බොහෝ විද්‍යාවන් සඳහා දර්ශනය පදනම සපයා ඇත. එමගින් මානව කුසලතා උපයෝගී කරගෙන දැනුම ගවේෂණය සඳහා අවශ්‍ය ශක්තිමත් පදනමක් සපයා ඇත. මෙම පර්යේෂණ ලිපිය පෙරදිග හා බටහිර දාර්ශනික සම්ප්‍රදායයන් දෙකට ම අදාළව දර්ශනවාදය, එහි ප්‍රධාන ශාඛා, සැලකිය යුතු ඓතිහාසික වර්ධනයන් සහ සමකාලීන සමාජය තුළ එහි ඇති අදාළත්වය පිළිබඳ හඳුන්වාදීමේ දළ විශ්ලේෂණයක් සැපයීම අරමුණු කරන බව පෙන්වා දිය හැකිය.

සමකාලීන දැනුම් පද්ධති සංවර්ධනය කිරීමේදී බහුවිෂයික ප්‍රවේශය සඳහා මාධ්‍යයක් ලෙස දර්ශනය අදටත් බෙහෙවින් අදාළ වන විෂය පද්ධතියකි. එය විවේචනාත්මක චින්තනය, සදාචාරාත්මක තර්කණය සහ තාර්කික විශ්ලේෂණය වැනි දැනුම සෙවීමේ මෙවලම් ඉදිරිපත් කරයි. ඒ අතරම, එය පුද්ගලයාට සංකීර්ණ සදාචාරාත්මක උභතෝකෝටික පැහැදිලි කර ගැනීමට මෙන්ම විද්‍යාත්මක හා තාක්ෂණික දියුණුවේ ඇඟවුම් තේරුම් ගැනීමට සහ මානව තත්ත්වය පිළිබඳ අර්ථවත් සංවාදයක යෙදීමට ද උපකාරී වේ. මෙම ලිපිය ප්‍රධාන වශයෙන් දර්ශනවාදයේ ස්වභාවය, එහි විෂය පථය සහ දැනුමේ මූලාශ්‍රයක් ලෙස මෑතකාලීන වශයෙන් එහි ඇති වූ සංවර්ධනය ගැන සාකච්ඡා කරයි. දර්ශනය වූ කලී අද්විතීය ක්‍රමවේද සහිත ස්වාධීන විෂයයක් වුවද, සමස්තයක් ලෙස අනිකුත් සියලු විෂයයන් සඳහා

අදාළ වන එහි යෙදවුම් ප්‍රතික්ෂේප කළ නොහැකි දායකත්වයන් ය. මේ අනුව, එය විවිධ දැනුම් ක්ෂේත්‍රවල සමකාලීන මානව චින්තනය වර්ධනය කිරීම සඳහා බෙහෙවින් දායක වන වටිනා මෙවලමක් ලෙස ක්‍රියාත්මක වෙමින් පවතී. එබැවින් මෙම පර්යේෂණය දාර්ශනික විමර්ශනය පිළිබඳ සාකල්‍යාත්මක විශ්ලේෂණයක් ලෙස ඉදිරිපත් වන්නේය.

දර්ශනය ලෙස සැලකෙන්නේ ලොව බිහිවූ පැරණිතම මෙන්ම විද්‍යාත්මක ස්වරූපයක් ගත් දැනුම් පද්ධතියකි. හුදෙක් විශ්වාසය හා ඇදහිල්ල මත පදනම්ව ලෝකය තේරුම් ගැනීම වෙනුවට කිසියම් න්‍යායාත්මක හා තර්කානුකූල දැක්මක් ඇතිව ලෝකය අවබෝධ කර ගැනීමට අමතරව අනිකාට පැහැදිලි වන සේ විවරණය කිරීම ද දාර්ශනික ව්‍යායාමය තුළ දක්නට ලැබෙන ලක්ෂණ වේ. එක් අතකින් දාර්ශනික අදහස් බිහි වීම සැලකෙන්නේ මානව චින්තනයේ උසස් දියුණු අවස්ථාවක් ලෙස යි. අනික් අතින් පසුකාලීනව මිනිසා තම අවට ලෝකය තේරුම් ගැනීමට ගොඩනගාගත් විවිධ විෂයයන් සඳහා තාර්කික පදනමක් සැපයූවේ දර්ශනය යි. ලොව විවිධ භූගෝලීය ප්‍රදේශවල උපත ලැබූ දාර්ශනික චින්තන ධාරා ක්‍රමයෙන් පැතිර යාමේ ප්‍රතිඵලයක් ලෙස ඒවා අතර සම විෂමතා අධ්‍යයන කිරීම මෙන් ම ඒ ඔස්සේ නව සංකල්ප ජනනය වීමක් ද පසුකාලීනව දක්නට ලැබේ. මෙසේ ආරම්භයේ සිට ක්‍රමයෙන් අඛණ්ඩව දියුණු වූ විෂයයක් වන්නේ දර්ශනය යි. ඒ නිසා දර්ශනය පිළිබඳ වඩාත් පුළුල් වූ හැඳින්වීමක් ලබාදීම මෙම ශාස්ත්‍රීය ලිපියෙහි අරමුණයි. ඕනෑම දැනුම් පද්ධතියක පදනම දාර්ශනික වන කල ඒ සඳහා ශක්තිමත් සංකල්ප රාමුවක් හිමි වන්නේය. ඒ නිසා කවර විෂයයකින් වුවත් පර්යේෂණ කාර්යයයෙහි නිරත වන විද්‍යාර්ථීන්ට යම් ආකාරයක දාර්ශනික ඥානයක් පැවතීම අත්‍යවශ්‍ය බව බෙහෙවින් ම පිළිගන්නා කරුණකි (උයන්ගොඩ, 2022: 1-5).

දර්ශනයෙන් තොරවූ දැනුම් පද්ධතියක් සොයා ගැනීම උගහට ය. විද්‍යාත්මක හෝ විද්‍යාත්මක නොවන ඕනෑම දැනුමක් කාලාන්තරයක් සමාජ භාවිතයක් ලෙස පවතී නම් ඒ සඳහා කිසියම් දාර්ශනික සංකල්පයක් හෝ විධික්‍රමයක් මූලික වී ඇති බව පෙන්වා දිය හැකිය. එක් එක් විෂයයක් හුදකලාව ගෙන, ඒ සඳහා පදනම්ව

ඇති දාර්ශනිකත්වය ගැන වෙන වෙනම සාකච්ඡා කළ අවස්ථා අපට හමු වන්නේය. එහෙත් පොදුවේ ඕනෑම විෂයයකට බලපාන දාර්ශනික අවස්ථා ගැන කෙරෙන අධ්‍යයනයන් අපට හමුවන්නේ විරල වශයෙනි. එම පර්යේෂණ හිඩැස ආවරණය කිරීමේ අරමුණ ඇතිව දර්ශනය වඩාත් පුළුල් වූ සන්දර්භයක් තුළ හඳුන්වා දීමට මෙම පර්යේෂණ ලිපිය සම්පාදනය කෙරේ.

දාර්ශනික චින්තනයෙහි සර්වකාලීන අගය පෙන්වා දෙමින් එය සෑම විෂය ක්ෂේත්‍රයක් සමග ම බද්ධව පවතින බැව් පෙන්වා දීම මෙම පර්යේෂණයෙහි ප්‍රමුඛ අරමුණක් ලෙස පෙන්වා දිය හැකිය. ලොව පවත්නා විවිධ ප්‍රපංච තේරුම් ගැනීම උදෙසා මිනිසා විසින් ගොඩනංවාගෙන ඇති විෂය ක්ෂේත්‍රයන්ගේ තාර්කිකත්වය, සංකල්පීය පදනම හා ඇගයුම් සමුදාය සකස් කිරීමෙහි ලා දර්ශනය විසින් දක්වා ඇති දායකත්වය ගැන කිසියම් සමාලෝචනයක් කිරීම ද මෙම පර්යේෂණ ලිපියෙහි තවත් එක් අරමුණක් ලෙස පෙන්වා දිය හැකිය. මානව චින්තනයත් නූතන විද්‍යාවත් මේ තරමටම ලෝක තත්ත්වයන් කෙරෙහි බලපෑම් කරන තාක් සංවර්ධනය වීම උදෙසා දාර්ශනික ව්‍යායාමය දක්වා ඇත්තේ ඓතිහාසික වූ කාර්යභාරයකි. දාර්ශනික මූල බීජ ලෙස ප්‍රභවය වූ ඇතැම් සංකල්ප කාලයාගේ ඇවෑමෙන් පුළුල් විද්‍යාත්මක පද්ධති ලෙස දියුණු වූ ආකාරය විද්‍යාවේ ඉතිහාසය සොයා බලන කල්හි පැහැදිලි වන කරුණකි. දර්ශනය සාකල්‍යාත්මක ලෙස තේරුම් ගැනීමේ වැදගත්කම මෙහිදී වඩාත් අවධාරණය කෙරෙන්නේ එහි ඇති සමකාලීන අගය මතු කිරීමට පමණක් නොව සර්වකාලීනව එහි ඇති අදාළත්වය ස්ඵුට කොට දැක්වීම සඳහා ය. භෞගෝලීය වෙනස්කම් ඇතිව බිහිවූ විවිධ දාර්ශනික පද්ධති අතර විෂමතා පොදුවේ දක්නට ඇතත් ඒ ඒ සන්දර්භ තුළ ඒවා වැදගත් වූ ආකාරය මෙහිදී අවධාරණය කරනු ලැබේ. ඒ නිසා දර්ශනය ගැන සාමාන්‍ය හැඳින්වීමක් සැපයෙන අතරම විවිධ විෂයයන් අතර සාම්‍යයක් හා අන්තර් විෂයයික වශයෙන් පවත්නා අන්තර් පැවැත්ම පිළිබඳ අවබෝධයක් ද මෙ මගින් ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මෙවැනි පර්යේෂණයක් ප්‍රධාන වශයෙන් වැදගත් වන්නේ දර්ශනය ප්‍රධාන විෂයයක් වශයෙන් හදාරා නැති විද්‍යාර්ථීන්ට ය. දාර්ශනික ඥානය කෙසේ තම විෂය ක්ෂේත්‍රයන්ගේ දියුණුවට හෝ

පර්යේෂණ සඳහා අදාළ කරගත හැක්කේ කෙසේදැයි ඇතැම් අවස්ථාවක ප්‍රශ්න මතු කරනු දක්නට ලැබේ. එමෙන්ම දැන හෝ නොදැන දාර්ශනික සංකල්ප ඒ ඒ විෂයයන්ගේ කරුණු, තේමා ආදිය පැහැදිලි කිරීමේදී යොදා ගන්නා අවස්ථා අපට දක්නට ලැබේ. එවැනි පසුබිමක වඩාත් විධිමත්ව දාර්ශනික ඥානය අදාළ කර ගැනීමට අවකාශය ඇති බව දර්ශනය පිළිබඳ සාකල්‍යාත්මක විශ්ලේෂණයක් තුළින් පැහැදිලි වනු ඇත. තවද ඕනෑම විෂයයකට දාර්ශනික පදනමක් ඇති බවත් දාර්ශනික සංකල්ප ඒවා පෝෂණය කරන බවත් පැහැදිලි වන්නේ දර්ශනය යනු කුමක්දැයි පැහැදිලි අවබෝධයක් ඇති කර ගැනීමෙන් ය. තවද දර්ශනය විෂයයක් වශයෙන් කොතරම් පුළුල් ක්ෂේත්‍රයක් ආවරණය කරන්නේදැයි පැහැදිලි කර ගැනීමට ද මෙම පර්යේෂණ ලිපිය වැදගත් වේයැයි සැලකේ. දර්ශනය වෙනත් විෂයයන් සමග බද්ධ වීමෙන් බිහි වී ඇති උප විෂයයන්ගේ කාලීන වැදගත්කම පිළිබඳව ද මෙමගින් විග්‍රහයක් ඉදිරිපත් වන නිසා අන්තර් විෂයයීක හා බහුවිධ මානනීය ප්‍රවේශයන්ගේ වැදගත්කම ගැන පැහැදලි අවබෝධයක් ද මෙයින් ඉදිරිපත් වන්නේය. දාර්ශනික ඥානය උපයෝගී කරගෙන නව දැනුම සොයා යාම හා පවත්නා දැනුම ගැන ප්‍රශ්න කිරීමට ද දාර්ශනිකයාට ලැබෙන නිදහස ගැන ද මෙහිදී යම් අදහසක් ඇතිකර ගැනීමට අවකාශය ලැබෙනු ඇත. දාර්ශනික ඉතිහාසය ගැන මෙන්ම එහි විවිධ උප විෂයයන් ගැන කෙරෙන සාකච්ඡාව ද විද්‍යාර්ථීන්ගේ ප්‍රයෝජනයට බෙහෙවින් ම වැදගත් වන්නේය. අනිකුත් විෂයයන්ගේ ප්‍රාමාණිකයන්ට වඩා දාර්ශනිකයාට සංකල්ප විග්‍රහ කිරීමටත් ප්‍රශ්න මතු කිරීමටත් ලැබෙන ශාස්ත්‍රීය නිදහස ඉමහත් බව මෙහිදී පැහැදිලි වනු ඇත. අවසාන වශයෙන් සෑම අයෙකු ම යම් ආකාරයක දාර්ශනික බවක් ප්‍රකට කළ යුත්තේ මන්දැයි පැහැදිලි කර ගැනීමටත් දැනුමෙහි අඛණ්ඩතාවයට දර්ශනයෙහි ඇති අදාළත්වය ගැන අවබෝධයක් ලබා ගැනීමටත් මෙම පර්යේෂණ ලිපිය ප්‍රයෝජනවත් වේයැයි සැලකිය හැකිය.

මෙහිදී භාවිත කරන විධික්‍රමය දාර්ශනික ක්‍රමය යි. විෂයයක් වශයෙන් දර්ශනය සැලකෙන්නේ ද්විතියික ගණයේ දැනුම පද්ධතියක් ලෙස යි. ඒ නිසා දාර්ශනික දෘෂ්ටි කෝණයෙන් පළමු ගණයේ විෂයයන් දෙස බැලීමට හා අර්ථකථන ඉදිරිපත් කිරීමට දාර්ශනිකයාට ඓතිහාසිකව ම නිදහසක් හිමිව තිබේ. උදාහරණ ලෙස සාමය

නැමැති සංකල්පය හෝ ආගම නැමැති ප්‍රපංචය අයිති වන්නේ පළමු ගණයේ විෂය පද්ධතීන්ට ය. දාර්ශනිකයා සාමය පිළිබඳ සංකල්පය දාර්ශනික ප්‍රස්තුතයක් ලෙස ගෙන එහි විවිධ මානයන් ගැන සිදුකරන විග්‍රහය සාම සංකල්පයෙහි දියුණුවට හේතු වන්නේය. තවද දර්ශනය වැනි විෂයයකට තවත් ක්ෂේත්‍රයකට අවශ්‍ය තාර්කික හා ශක්තිමත් පදනමක් සපයන්නට හැකිය. මෙහි එක් වැදගත් ක්‍රමයක් වන්නේ සොක්‍රටීක යුගයේ සිට ම පවතින ප්‍රශ්න නැගීමයි (කලන්සූරිය, 1987: 8). ඒ නිසා සාමය ගැන කථා කරන දාර්ශනිකයින්ට යුද්ධයේ සහ ප්‍රචණ්ඩකමේ ඇති ආචාරාත්මක බව ප්‍රශ්න කිරීමට සම්පූර්ණ නිදහසක් තිබේ. නූතන සමාජ හා මානවීය විද්‍යා ක්ෂේත්‍රවල අධ්‍යයනයට බලපා තිබෙන විචාරාත්මක න්‍යාය ද මෙහි ලා භාවිත කෙරෙන ක්‍රමවේදයෙහි න්‍යායාත්මක පදනම සපයනු ලබයි. මෙහිදී දත්ත එකතු කිරීමේ ක්‍රමය අදාළ සාහිත්‍යය ගවේෂණය මත තීරණය වන්නේය. අදාළ ප්‍රාථමික සහ ද්විතීයික මූලාශ්‍රය මත පදනම් ව මේ සඳහා අවශ්‍ය තොරතුරු ගවේෂණය කරන ලදී.

**සාකච්ඡාව**

නූතන දාර්ශනික විචාරකයන් විවිධ විද්‍යා හා දැනුම් පද්ධති වර්ග කරන විට දර්ශනය ද්වීතීයික ගණයේ විෂයයක් ලෙස හඳුනාගෙන ඇත. එවැනි විෂයක ඇති විශේෂත්වය වන්නේ ඕනෑම පළමු ගණයේ විෂයයක කරුණු අධ්‍යයනය සඳහා ආධාරකයක් ලෙස යොදා ගැනීමට ඇති හැකියාව යි. ඒ අනුව ගණිතය - තර්කනය සේ ම දර්ශනය ද ද්වීතියික ගණයෙහි කාර්යයක් සිදු කරයි. ඒ සඳහා විශ්ලේෂී ක්‍රමය බොහෝ විට භාවිත කරනු ලැබේ. දර්ශනය විසින් සිදුකරනු ලබන දෙවැනි ගණයේ කාර්යභාරය තේරුම් ගැනීම සඳහා පහත දැක්වෙන සටහන බෙහෙවින් ම උපයෝගී වන බව පෙන්වා දිය හැකිය.



දර්ශනය නැමැති ද්විතීයික ගණයෙහි ලා ගැනෙන විෂයය විසින් පළමු ගණයේ විෂයයන් ගැන සිදු කරන ඕනෑම ආකාරයක අධ්‍යයනයක් දාර්ශනික අධ්‍යයනයක් ලෙස හඳුනාගත හැකිය. සමාජීය විද්‍යාවක හෝ ස්වාභාවික විද්‍යාවක හෝ අන්තර්ගත දැනුම ගැන අවශ්‍ය නම් ප්‍රශ්න කිරීමට හෝ විචාරාත්මකව කරුණු දැක්වීමට දාර්ශනිකයාට ඓතිහාසික වශයෙන් ම නිදහසක් හිමිව තිබේ (එදිරිසිංහ, 2008: 18-22). උදාහරණ වශයෙන් ඕනෑම විද්‍යාවක සිදුකෙරෙන පර්යේෂණ තුළ හෝ භාවිතය තුළ පැනනගින ආචාරාත්මක ගැටලු ගැන ආචාරවාදියා නිරන්තරයෙන් ම අවධානයෙන් කටයුතු කරයි. එවැනි ව්‍යායාමයක් අනිවාර්යයෙන් ම මානවයාගේ ප්‍රගමනය උදෙසා දායකත්වයක් දක්වන බව පැහැදිලි වන්නේ ය. සමකාලීන වශයෙන් දියුණු වූ පරිසර ආචාර විද්‍යාව හෝ පාරිසරික දර්ශනය වැනි විෂයයක් තිරසර සංවර්ධනයේදී පාරිසරික තත්ත්වයන් ගැන සලකා බැලීමේ වැදගත්කම අවධාරණය කරන්නේ එබැවිනි.

දර්ශනය යනු කුමක්ද? යන ගැටලුව සරලව පිළිතුරු දිය හැකි හෝ නිශ්චිත පිළිතුරක් හෝ නොමැති ගැටලුව කි. ඒ නිසා දර්ශනය යනු කුමන සවරූපය ගත් දැනුම් පද්ධතියක්දැයි හඳුනාගැනීම සඳහා කිසියම් ක්‍රමවේද කිහිපයක් අනුගමනය කිරීමට මෙහිදී අපේක්ෂා කෙරේ. පළමුව දර්ශනයෙහි ඉතිහාසය පදනම් කරගෙන දර්ශනයට කිසියම් නිර්වචනයක් හා අදහසක් ඇතිකර ගැනීම වැදගත් වේ. දර්ශනය නම් විෂයය වර්ෂ ක්‍රමානුගතව ගත් විට පළමුව ඈත භාරතයෙන් (පර්සියානු චින්තනය ද ඇතුළත්ව) හා චීනයෙන් ආරම්භ වී දෙවනුව ග්‍රීසිය කේන්ද්‍ර කොටගෙන බටහිර ආරම්භ වී ක්‍රමිකව අද දක්වා සංවර්ධනය වෙමින් පවත්නා වූ විෂයයක් වන අතර ඒ හේතුවෙන් ම ඉතා දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන විෂයයක් ලෙස ද හැඳින්විය හැකිය. ඉන්දියාව හා චීනය මුල්කොට ඇති වූ දර්ශනය පෙරදිග දර්ශනය ලෙසත් ග්‍රීසිය-රෝමය කේන්ද්‍ර කරගෙන ඇති වූ දර්ශනය අපරදිග නැතහොත් බටහිර දර්ශනය ලෙසත් පුළුල්ව අපි හඳුනා ගනිමු.

භාරතීය දර්ශනය ආරම්භ වන්නේ වෛදික දර්ශනයෙනි. වේද ග්‍රන්ථවල සඳහන් වන්නේ පැරණි ලෝකයේ දැනුම් පද්ධතිය යි. 'වේද' යන්නෙහි අරුත වන්නේද 'දැනුම' යන්න යි. වෛදික මිනිසා

ලෝකය ගැන දැනගත් අයුරු බහුවිධ න්‍යායයන් උපයෝගී කරගෙන විස්තර කෙරෙන වේද සූක්ත දාර්ශනික චින්තනයෙහි මූලික බීජමය අවස්ථා පෙන්නුම් කරයි. උදාහරණ ලෙස විශ්වයේ ආරම්භය ගැන කියැවෙන පුරුෂ සූක්තය වූ කලී විශ්වවේදය සම්බන්ධයෙන් ඉදිරිපත් වන පැරණිම ආඛ්‍යානයකි (ඤාණිස්සර හිමි, 2015: 14). නාසදීය ගීතය වූ කලී විශ්වාරම්භය ගැන තවමත් විසඳුමක් නැති ප්‍රශ්න රාශියක් මතු කරන දාර්ශනික වියමනකි. එහි ඉදිරිපත්වන බරපතල සංශය හා යථාර්ථය ගැන ඇති අනිර්වචනීය බව වර්ෂ හාරදහසකට පසුව වුවද තාමත් වලංගුතාවය ඇති දාර්ශනික විධික්‍රම ලෙස සැලකේ (ඤාණිස්සර හිමි, 2015: 15). සොබාදහම දෙවිදේවතාවියන්ගේ පදිංචි බිමක් ලෙස හඳුනාගෙන ඒ ආශ්‍රයෙන් තමා අවට ලෝකය තේරුම් ගත් බව මෙයින් පැහැදිලි වන්නේ ය. තවද 'ඍත' වැනි සංකල්පයක් ඔස්සේ මූලික ආචාර ධර්මීය සංකල්ප ද වෛදික මිනිසා හඳුන්වා දී ඇත. ඉන්පසුව ක්‍රමානුකූලව භාරතීය චින්තනය උපනිෂද්, ජෛන, බෞද්ධ, හින්දු ආදි දාර්ශනික සම්ප්‍රදායයන් ඔස්සේ දියුණු වන්නේ ය (විදානගමගේ, 1997: 18-20). භාරතීය දර්ශනයේ විශේෂත්වය වන්නේ දර්ශනය හා ආගම දෙක වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීමට ඇති දුෂ්කරතාවය යි. චීන දර්ශනය, තාඕ හා කොන්ෆියුසියානු දර්ශන පදනම් කරගෙන ප්‍රභවය වේ. එකිනෙකට අනුපූරක වන මේවා පුද්ගලයාගේ දියුණුවත් සමාජ ප්‍රගමනයත් අපේක්ෂා කරගෙන ඉදිරිපත් ව තිබේ.

පර්සියානු ප්‍රදේශය ගත් කල වර්තමානයේ මැද පෙරදිග ප්‍රදේශය ලෙස සැලකිය හැකිය. මධ්‍යම ආසියාවෙන් පැමිණි සංක්‍රමණික ආර්යයෝ කොටසක් ඉන්දියාවට පැමිණි අතර තවත් පිරිසක් වර්තමාන ඉරාන-ඉරාක ප්‍රදේශවල පදිංචි වූහ (Jayathilake, 1963 (24-28). ඔවුන් අතරින් බිහි වූ දර්ශනය අවෙස්තාව පදනම් වූ සොරෝඇස්ත්‍රියානු ලෝක දෘෂ්ටිය යි. එහි වෛදික චින්තනයට සමාන අදහස් දක්නට ලැබෙන අතර සොබාදහම තේරුම් ගැනීමේදී හා විවරණය කිරීමේදී බහුදේවවාදී චින්තනය පදනම් වූ බහුවිධ න්‍යායයන් උපයෝගී කරගෙන ඇත. එමෙන්ම දාර්ශනික වැදගත්කමක් දරණ ආචාර ධර්මීය සංකල්පනාවන් ද ඔවුන් විසින් ඉදිරිපත් කොට ඇත. ඉස්ලාමීය ආගමේ ප්‍රභවයත් සමගම අරාබි චින්තනය විශේෂයෙන් ඒක දේවවාදී දෘෂ්ටිය මත දියුණු වේ.

ග්‍රීසියේ දාර්ශනික චින්තනය බිහි වන්නේ තේල්ස් නැමති දාර්ශනිකයා විසින් අසන ලද ප්‍රබුද්ධ ප්‍රශ්නයක් මුල් කරගෙන යි. එනම්, "පැටලිලි සහිත මේ පෙනෙන ලොව තුළ පැටලිලි රහිත යථාර්ථය නම් කුමක්ද?'' යන දාර්ශනික ගැටලුව යි. යථාර්ථය පිළිබඳ ගවේෂණය දාර්ශනික ව්‍යායාමය තුළ කේන්ද්‍රීය වන්නේ බටහිර දර්ශනය ප්‍රභවය වූ අවස්ථාවේ සිට ම එහි මූලික ප්‍රස්තුතය වූ නිසා ය (කලන්සූරිය, 1997ඃ 29-31 ). දාර්ශනිකයා පෙනෙන, වෙනස් වන දෙයින් තෘප්තිමත් නොවන අතර ඒවාට පසුබිම් වූ යථාර්ථයක් පිළිබඳ ගවේෂණය කරයි. මෙම ගැටලුවට තේල්ස් ලබාදුන් පිළිතුර නම් ජලය යි. එය එක්තරා ආකාරයක විද්‍යාත්මක පිළිතුර කි. ඒ නිසා බටහිර විද්‍යාත්මක චින්තනයේ ආරම්භය ද තේල්ස් විසින් සනිටුවහන් කරන බව පෙන්වා දිය හැකිය. මෙය සර්වකාලීන අගයක් සහිත දාර්ශනික ගැටලුව කි. දාර්ශනික ප්‍රශ්න හැදීමේ හා ඉදිරිපත් කිරීමේ කලාව මෙයින් පැහැදිලි වන්නේ ය. ඉන් පසුව සොක්‍රටීස්ගෙන් ආරම්භ වන සම්භාව්‍ය ග්‍රීක දර්ශනයෙන් ප්‍රශ්න විමසීමේ කලාව දාර්ශනික චින්තනයට කොතෙක් දුරට වැදගත් වන්නේදැයි පැහැදිලි වේ. දාර්ශනිකයා නම් ඕනෑම ආකාරයේ ගැටලුවක් විශ්ලේෂණය කොට අදහස් ඉදිරිපත් කිරීමට සමර්ථකම් දක්වන පුද්ගලයෙකු ලෙස සම්භාවනාවට ලක් වන්නේ එහි ප්‍රතිඵලයක් වශයෙනි.

බටහිර දර්ශන ඉතිහාසය අවධි කිහිපයක් ඔස්සේ සංවර්ධනය වන බව පෙන්වා දිය හැකි ය. අධ්‍යයනයෙහි පහසුව තකා යුග පහක් ඔස්සේ බටහිර දර්ශනය හදාරනු ලැබේ (විදානගමගේ, 1997ඃ 25-30).

1. ඈත ග්‍රීක දාර්ශනික යුගය
2. මධ්‍යතන දාර්ශනික යුගය
3. නූතන දාර්ශනික යුගය
4. සමකාලීන දාර්ශනික යුගය
5. පශ්චාත් නූතන දාර්ශනික යුගය

බටහිර දර්ශනය මෙසේ අවධි ඔස්සේ බෙදා වෙන් කොට හඳුනාගන්නේ දාර්ශනික කාර්යය හා එහි ස්වභාවය ගැන තිබූ පිළිගැනීම් හා නිර්වචන ආදිය කලින් කල වෙනස් වූ නිසා ය.

උදාහරණ ලෙස මධ්‍යතන යුගයේ දාර්ශනිකයාගේ කාර්යය වූයේ සත්‍ය ගවේෂණය හෝ යථාර්ථය සොයා යාම නොවේ. මන්ද දේවධර්මවාදී චින්තනයට අනුව ඒ වන විටත් දාර්ශනික කාර්යය ඉටු කොට පරිසමාප්තියක් කරා පැමිණ තිබිණි. ඒ අනුව දාර්ශනිකයාට පැවරී තිබුණේ ඒ වන විටත් අනාවරණය කරගෙන තිබූ යථාර්ථය සාමාන්‍ය ජනතාවට පැහැදිලි වන සේ විවරණය කිරීම යි. බටහිර දර්ශනය පද්ධතිකරණයකට යොමු වන්නේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. මේ නිසා දර්ශනයෙහි ස්වභාවය හා කාර්යය තේරුම් ගැනීමේදී අදාළ යුගයට හා භෞගෝලීය තත්ත්වයට අනුව සාපේක්ෂ ව තේරුම් ගත යුතු බව පැහැදිලි වන්නේ ය (රසල්, 2015ඃ 5-11).

දර්ශනය යනු කුමක්ද? යන ගැටලුවට පිළිතුරක් සොයා ගැනීමේ තවත් ක්‍රමයක් ලෙස එම වචනයෙහි නිරුක්තිය හා එහි අර්ථය පැහැදිලි කර ගැනීම දැක්විය හැකිය. මෙය එක්තරා ආකාරයක වාග් විද්‍යාත්මක ප්‍රවේශයක් ලෙස හඳුනාගත හැකිය. අප සිංහල භාෂාවෙන් භාවිත කරන 'දර්ශනය' නැමති නාම පදය සංස්කෘත භාෂාවෙන් ලබා ගත්තකි. 'දර්ශන' යන්නෙන් 'දැකීම' යන අරුත සීමනය කරයි. මෙසේ දකින්නේ සමාන්‍ය ඇසින් ලබන වස්තූන් හෝ දත්ත නොවේ. ඇස මනාව ක්‍රියා කරන ඕනෑම අයෙකුට ලෝකය ප්‍රත්‍යක්ෂ කළ හැකිය. ඒ ගැන ඥානනය කළ හැකිය. ඇසෙන් ලබන දැනුම මේ නිසා වාස්තවික වන්නේය. එහෙත් දාර්ශනිකයා අත්දකින දේ සාමාන්‍ය අත්දැකීම් සීමාව ඉක්මවා පවතින තත්ත්වයකි. එය ඇතැම් විට මනස නැමැති ඇස දියුණු කිරීම මගින් ලබන දැනුමකි. නැතහොත් තුන්වැනි ඇසකින් දකින දෙයකි. යථාර්ථය හෝ සත්‍යය වැනි අතීන්ද්‍රිය අනුභූතියක් මේ අනුව සැලකෙන්නේ සුවිශේෂී දැනුමක් ලෙස යි. දර්ශනය වනාහි සමස්ත පංචේන්ද්‍රියන් ද මනස නම් වූ චින්තාමය ඉන්ද්‍රියය ද සංයුක්ත වී ලෝකය හා සමස්ත ජීවීමය පරිසරය සමඟ ක්‍රියාත්මක වන සමස්ත ප්‍රපංචමය ක්‍රියාවලිය පිළිබඳ ඇති කර ගන්නා දැකීම යි. එය සුවිශේෂී ආකාරයක දැනුම කි. එබැවින් දර්ශනය යන්න 'දැකීම' ලෙස අර්ථ දක්වන විට එම 'දැකීම' යනු කුමක්දැයි සවිස්තරව නිර්වචනය කළ යුතුය. නැතිනම් එය දර්ශනය ගැන ඇති කර ගන්නා වූ නිවැරදි අවබෝධයක් වන්නේ නැත. ඒ නිසා දාර්ශනික දැක්මක් ඇති තැන පුළුල් වූ ලෝක දෘෂ්ටියක් ඇත. දාර්ශනිකයා ලෝකය තේරුම් ගන්නේ එම ලෝක දැක්මට සාපේක්ෂ වශයෙනි.

තවද ඒ දැක්ම අනිකාට විස්තර කරන්නේ ද දාර්ශනික ඥානයෙන් ලබාගත් අවබෝධයට සාපේක්ෂ වශයෙනි. උපනිෂද් දාර්ශනිකයින් මෙම තත්ත්වය 'අන්වීක්ෂිකි' නැතහොත් සියුම්ව දක්නා තත්ත්වයක් ලෙස සඳහන් කළේ මෙම දාර්ශනික අවබෝධය වෙසෙසා දැක්වීමට විය හැකිය. එසේ ලබා ගන්නා සුවිශේෂී අත්දැකීමක් පරම සත්‍ය, පරම ගුහ්‍ය වැනි භාවිත මගින් සුවිශේෂී ඥානයක් වන අයුරු පැහැදිලි කොට දක්වා ඇත.

දර්ශන නම් සංස්කෘත වදනට සමීප පාලි වදන 'දස්සන' යන්න යි. නමුත් එය මසැසින් දක්නා වූ දැකීමට ආපාථගත වේ. දර්ශනය නම් විෂයයට එන පාලි වදන ලෙස ගත හැක්කේ 'දිට්ඨි' යන්න යි. එය පාලි නිකායාගත සාහිත්‍යය තුළ නිතරම සඳහන් වන වදනක් ලෙස පෙන්වා දිය හැකිය. 'දිට්ඨි' යන්නට සමාන සංස්කෘත වදන 'දෘෂ්ටි' වන අතර එය නොවෙනස්ව සිංහල භාෂාමය සන්දර්භය තුළ ද භාවිත වේ. ඒ අනුව විවිධ දෘෂ්ටි ගත් නැතිනම් විවිධ දර්ශන වාදයන් ඉදිරිපත් කළ දාර්ශනිකයන් ගැන පාලි ත්‍රිපිටක සාහිත්‍යයේ සඳහන් වේ. හොඳම උදාහරණය දීඝ නිකායේ බ්‍රහ්මජාල සූත්‍රය යි (දීඝ නිකාය, 1956ඃ 01). එහි ලා තත් කාලීන භාරතයේ පැවති දර්ශන වාද හැට දෙකක් පිළිබඳව විස්තර වේ. 'බ්‍රහ්ම' යනු ද 'දර්ශන' නැතිනම් 'දෘෂ්ටි' නම් වදනට සමාන වදන කි. ඒ අනුව ක්‍රිස්තු පූර්ව හය වන සියවස වන විට විවිධ දර්ශන වාද ජාලයකින් භාරතය වෙළී පැවති බව පැහැදිලි ය. ලෝකය හා සත්වයා පිළිබඳව විවිධ අයුරින් විවරණය කළ මෙම දර්ශනවාද ශාස්වත හා උච්ඡේද වශයෙන් දෙකොටසකට බෙදා දක්වන බුදුදහම ඒ එකකින්වත් යථාර්ථවත් ලෙසින් ලෝකය හා සත්ත්වයා ගැන විවරණය නොවන බව සඳහන් කරයි. එබැවින් ඒවා අන්ත ස්පර්ශ කරන දර්ශන වාද සේ සැලකේ.

සාමාන්‍යයෙන් දර්ශන වාද සඳහා සත්‍ය හෝ අසත්‍ය යන විශේෂණ භාවිත කිරීම සිදු නොවන දෙයකි. එහෙත් බෞද්ධ දර්ශනයෙහි දෘෂ්ටීන් හෙවත් දාර්ශනික වාද 'සම්මා' නැතහොත් 'නිවැරදි' සහ 'මිච්ඡා' නැතහොත් 'වැරදි' ලෙස අර්ථ ගන්වා තිබීම විශේෂත්වය කි. ඉහත කී බ්‍රහ්මජාල සූත්‍රයේ එන දෘෂ්ටිවාද සියල්ල ම මිථ්‍යා දෘෂ්ටීන් ලෙස හඳුනාගෙන ඇත (දීඝ නිකාය, 1956ඃ 1). බුදුන් වහන්සේ යොදාගත් මෙම ක්‍රමවේදය චන්දිම විජේබණ්ඩාර

හඳුනාගන්නේ විචාරාත්මක ඉවසීම යනුවෙනි (Wijebandara, 1993: 95-99). දෘෂ්ටිගතික වීමෙහි ඇති අවදානම පැහැදිලි කරන අතර ම එවැනි දෘෂ්ටීන් ගැන ඉවසීම නැමති ගුණය ද මෙහිදී ප්‍රකට වන තත්ත්වය කි. දෘෂ්ටීන් නිසා ආගමික-දාර්ශනික මතවාදීන් අතර ඇති වූ සට්ටනය මෙන් ම ඒ පදනම් කරගෙන මිනිසුන් අතර ඇති වූ බෙදීම් කරණ කොටගෙන ආගමික සාමය බිඳවැටී තිබුණු ආකාරය ද බෞද්ධ මූලාශ්‍රයන්ගේ සඳහන් වේ (Wijebandara, 1993: 19-25). එබැවින් බෞද්ධ දර්ශනය හැට තෙවැනි දර්ශනයක් ඉදිරිපත් නොකළ බව පැහැදිලි ය. එවිට බෞද්ධ දර්ශනයෙහි ඇති ලෝක දෘෂ්ටිය කුමක්ද? යන ප්‍රශ්නය ඇති වේ. එසේනම්, බෞද්ධ දර්ශනය ලෙස වෙසෙසා දක්වන බුදුරජාණන් වහන්සේගේ දේශනාව දර්ශනයක් නොවන්නේද? යන ගැටලුව පැන නඟී. බෞද්ධ චින්තනය ශාස්වත හෝ උච්ඡේද යන කිසිදු අන්තවාදයත් භජනය නොකරන්නා වූ දර්ශනයකි. එබැවින් බෞද්ධ දර්ශනය භාරතීය ආගමික හා දාර්ශනික පසුබිම තුළ පහළ වූ හැටතුන් වැනි දෘෂ්ටිය නොවන්නා සේ ම දෘෂ්ටි ප්‍රහාණය තුළින් පමණක් නියම දර්ශනය අත්පත් කර ගත හැකි බව දක්වන්නා වූ ද එකම දර්ශනය වන්නේ ය. එබැවින් බෞද්ධ දර්ශනය වනාහි තත්ත්වානුකූල වූ ද යථාර්ථවත් දර්ශනයක් ලෙස හඳුන්වා දිය හැකිය.

''ඒතේ තේ උභෝ අන්තේ අනුපගම්මේන මජ්ඣෙන තථාගතෝ ධම්මං දේසේති'' (සංයුක්ත නිකාය, 1956: 12-15)

මේ උපුටා ගැනීමට අනුව බුද්ධ දේශනාව වනාහි 'සබ්බං අත්ථි' (සියල්ල ඇත) යන ශාස්වතවාදී දෘෂ්ටිය ද 'සබ්බං නත්ථි' (සියල්ල නැත) යන උච්ඡේදවාදී දෘෂ්ටීන් ද දුරු කොට මාධ්‍යමක වූ දේශනාවකින් සමන්විත වන බව පෙන්වා දිය හැකිය. බෞද්ධ මතයට අනුව නියමාකාර දර්ශනය වන්නේද දෘෂ්ටීන්ගෙන් වෙන් වූ මිදුණු ස්වභාවය යි. මේ අනුව තත්ත්වාකාර දර්ශනය ඇති කරන (යථාභූත ඤාණදස්සන) බෞද්ධ දර්ශනය භාරතීය දර්ශනයන්ගේ පරිසමාප්තිය සටහන් කරයි. දාර්ශනික චින්තනයෙහි ඇති සාපේක්ෂකත්වය පෙන්වා දෙමින් දෘෂ්ටීන්ගෙන් විනිර්මුක්ත ස්වභාවය පසුකාලීනව නාගාර්ජුනපාදයන් 'ශූන්‍යතාව' ලෙස හඳුන්වා දුන්නේය (ඤාණිස්සර හිමි, 2015: 113).

භෞගෝලීය වශයෙන් පෙරදිගට අමතරව බටහිර දෙසින් දාර්ශනිකයන් යැයි කිවහැකි පිරිසක් මුලින් ම බිහිවූයේ ඇත ග්‍රීසියේ ය. ග්‍රීක භාෂාවෙහි එන "Philo" සහ "Sophia" යන වදන් දෙකෙහි සංයුක්ත වීමක් ලෙස ඉංග්‍රීසි භාෂාවෙහි 'දර්ශනය' නම් විෂයය හැඳින්වීමට යොදනු ලබන "Philosophy" යන වදන නිෂ්පත්ති වී ඇතැයි සාමාන්‍යයෙන් සලකනු ලැබේ. "Philo" යන්නෙහි අර්ථය ''කැමැත්ත'' හෝ ''ප්‍රිය බව'' යන්න යි. "Sophia" යන්නෙහි අර්ථය ''ප්‍රඥාව'' නැතහොත් ''නුවණ'' යන්න යි. මේ අනුව "Philosophy" යන්නෙහි අරුත ''ප්‍රඥාව සඳහා ඇති කැමැත්ත'' (Love of wisdom) ලෙස පෙන්වා දිය හැකිය. එම ක්ෂේත්‍රය තුළ ක්‍රියා කරන නැතහොත් ප්‍රඥාව ගවේෂණය කරන්නා හඳුන්වන්නේ "Philosopher" (දාර්ශනිකයා) ලෙස ය. ''දාර්ශනිකයා වනාහි ප්‍රඥාවට ලැදි තැනැත්තා ය.'' යනුවෙන් නිර්වචනය කර ඇත (විදානගමගේ, 1997: 3). ග්‍රීක යුගයේ ආරම්භක අවස්ථාවේ දර්ශනය ගැන කථා කරන විට ඒ සඳහා ගෙනෙන උක්ත නිර්වචනය සතුටුදායක වුවත් කාලයාගේ ඇවෑමෙන් එහි කාර්යභාරය පුළුල් වීම හා ක්ෂේත්‍රය පළල් වීම ගැන සලකා බලන විට එම නිර්වචනය සදාතනික අරුතක් නොදෙන බව පැහැදිලි වෙනු ඇත. එම නිසා දර්ශනය ගැන කිසියම් නිර්වචනයක් ගෙනෙන විට හා එහි ක්ෂේත්‍රය හා කාර්යභාරය ගැන නිගමනයකට එන විට එය කළ යුත්තේ අදාළ කාල වකවානුවට මෙන් ම අදාළ සමාජ, දේශපාලනික හා ආර්ථික පසුබිමට සාපේක්ෂවය යන්න විශේෂයෙන් අවධාරණය කළ යුතු කරුණක් වේ.

දර්ශනය නම් විෂයය පැහැදිලිව නිර්වචනය කර දැක්වීම තරමක් අපහසු දෙයක් බව මෙම ලිපිය ආරම්භයේදී ම ප්‍රකාශ කරන්නට යෙදුණි. ඊට හේතු වන්නේ අනිකුත් සෑම විෂයයකට ම පෙර දර්ශනය නම් විෂයය ලොව ප්‍රභවයට පත් වීමත් ඒ හේතුව නිසා එය දීර්ඝ කාලීන ඉතිහාසයකට උරුමකම් කීමත් ය. අනික් අතට දර්ශනය නම් විෂයයට අයත් වන්නා වූ විෂය ක්ෂේත්‍රය ද ඉතා පුළුල් වන බැවින් මෙම නිර්වචනීය දුෂ්කරතාවය තවත් බැරෑරුම් වන බව පෙන්වා දිය හැකිය. නමුත් දර්ශනය වනාහි ලොව හා එහි වසන ජීවීන් හා අනිකුත් සියලු ප්‍රපංච පිළිබඳව ගැඹුරු, තාර්කික හා යථාර්ථමත් විනිශ්චයක් ළඟා කර දෙන විෂයයක් ලෙස හැඳින්විය හැකිය.

දාර්ශනිකයින් කිහිප දෙනෙකු විසින් දර්ශනය පිළිබඳ ඉදිරිපත් කරන ලද නිර්වචන කිහිපයක් මෙහිදී ගෙනහැර දක්වන්නේ විද්වත් නිර්වචන පදනම් කරගෙන ද දර්ශනයෙහි ස්වභාවය ගැන කිසියම් ආකාරයක අවබෝධයක් ලබාගත හැකි නිසා ය (විදානගමගේ, 1997).

''දිට්ඨිංච අනුපගම්ම සීලවා දස්සනේන සම්පන්නෝ '' (සංයුක්ත නිකාය, 1956: 1-8)

(දර්ශන සම්පත්තිය යනු දෘෂ්ටීන් ප්‍රහාණය කොට සදාචාර සම්පන්න වීම යි.) -බුදුන් වහන්සේ-

''දාර්ශනිකයින් ලෝකය විවිධාකාර ලෙස විවරණය කොට ඇත. නමුත් කළ යුත්තේ ලෝකය වෙනස් කිරීම යි.''

-කාල් මාක්ස්-

''දර්ශනය වනාහි භාෂාවේ විවිධාර්ථ ලෙස ඉදිරිපත් වන වචනවලට එරෙහිව කරන සටන කි.''

-විට්ගන්ස්ටෛන්-

''දර්ශනය ආගම හා විද්‍යාව අතර පවත්නා දෙයකි. ආගමට හෝ විද්‍යාවට හසු නොවන දෑ දර්ශනයේ අධ්‍යයනයට හසු වේ.''

-බර්ට්‍රන්ඩ් රසල්-

''දර්ශනය අධ්‍යයනය කරනු ලබන්නේ පරම, වියුක්ත හා පොදු ගැටලු ය. මෙම ගැටලු පැවැත්මේ ස්වභාවය, දැනීම, සදාචාරය, තර්කනය සහ මානව පරමාර්ථ හා සම්බන්ධව පවතී.''

-එවන්ස්-

මෙම නිර්වචන ගත් කල සමානතා මෙන්ම අසමානතා ද දක්නට ලැබේ. ඒ ඒ දාර්ශනිකයාගේ කාලයට හා දේශයට සාපේක්ෂව දාර්ශනිකයා විසින් කළ යුත්තේ කුමක්දැයි යන ගැටලුවට හඳුනාගත් පිළිතුරු ආශ්‍රයෙන් මෙම නිර්වචන ඉදිරිපත්ව තිබේ. ඒවා දර්ශනයෙහි විවිධ පැතිකඩ ස්පර්ශ කරන බව පෙන්වා දිය හැකිය (Nagel, 1987: 48).

දර්ශනය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගැනීම සඳහා අනුගමනය කළ හැකි තවත් එක් වැදගත් විධි ක්‍රමයක් ලෙස දර්ශනයේ විෂය ක්ෂේත්‍රය සලකා බැලීම දැක්විය හැකිය. ඒ අනුව දර්ශනය නම් විෂයයට අයත් උප විෂයයන් මොනවාද? නැතිනම් දර්ශනය නම් විෂයයේ විෂය ක්ෂේත්‍රය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම මගින් එහි කාර්යභාරය ගැන දැනුමක් ලබා ගැනීම වැදගත් වේ. මෙහිදී පෙරදිග හා බටහිර ලෙස භූගෝලීය පරිසර දෙකක පහළ වූ දර්ශනවාදයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය. දර්ශනය සර්වත්‍ර කුලකය ලෙස ගතහොත් එයට අයත් වන්නා වූ උප කුලක ලෙස පහත දැක්වෙන විෂයයන් ගෙනහැර දැක්විය හැකිය (එදිරිසිංහ, 2008ඃ 9).

01. ඥාන විභාගය (Epistemology)

02. අධිභෞතික විද්‍යාව (Metaphysics)

03. තර්ක ශාස්ත්‍රය (Logic)

04. ආචාර ධර්ම (Ethics)

05. සෞන්දර්ය විද්‍යාව (Aesthetics)

පුද්ගලයා දැනුම ලබා ගන්නේ කෙසේ ද? යන්න දර්ශන විෂයෙහි කේන්ද්‍රීය ගැටලුව කි. පෙරදිග මෙන්ම අපරදිග දාර්ශනිකයන් මේ පිළිබඳව සාකච්ඡා කොට ඇත. බටහිර දර්ශනයෙහි බුද්ධිවාදීන් සහ අනුභූතිවාදීන් ලෙස කොටස් දෙකකට බෙදෙන මෙම ඥාන මාර්ග භාරතීය දර්ශනය තුළ වර්ග තුනක් (සාම්ප්‍රදායවාදීන්/ අනුභූතිවාදීන් සහ බුද්ධිවාදීන්) දක්නට ලැබෙන බව මහාචාර්ය කේ.එන්. ජයතිලකයන් පෙන්වා දෙයි (Jayathilake, 1963ඃ 24-35). දැනුම අන්තර්ගත වන්නේ මනස තුළ බැවින් නිදහසේ තර්කානුකූලව කල්පනා කිරීමෙන් දැනුම ලබා ගත හැකි බව බුද්ධිවාදීන් පෙන්වා දෙයි. අනුභූතිවාදීන් පෙන්වා දෙන්නේ දැනුම ලබා ගැනීමට ඇති එකම ක්‍රමවේදය ඉන්ද්‍රියයන් පමණක් බව යි. මේ අනුව ඥාන විභාගවාදය තුළ අසනු ලබන ප්‍රශ්න කිහිපය කි. ඥානය යනු කුමක් ද?, ඥානය හා විශ්වාසය අතර වෙනස කුමක් ද?, ඥාන මාර්ග මොනවාද?, ඥානය විස්තර කරන්නේ කෙසේ ද? යන ප්‍රශ්න විමර්ශනය කිරීම ඥාන විභාගවාදයට අයත් වේ.

අධි භෞතික යන්නෙහි අදහස භෞතිකමය ඉන්ද්‍රිය විෂයී ලෝකයෙන් එහා වූ යන්න යි. දේවත්වය, ආත්මය, පරමාත්මය වැනි දාර්ශනික ප්‍රස්තුත ඉන්ද්‍රිය විෂයී ලෝකයෙන් එහා පවතින සංකල්ප වේ. දේවත්වය, විශ්ව නිර්මාණවාදය පැහැදිලි කිරීමට සමහර දාර්ශනිකයන් මෙය උපයෝගී කොට ගෙන ඇත. එහෙත් එම තත්ත්වය පිළිබඳ සංකල්පීය වශයෙන් සත්‍ය අසත්‍යතාවය ද පෙන්වාදිය නොහැකි අධි භෞතික සංකල්පයකි. මෙවැනි සංකල්ප පාර භෞතික විද්‍යාව යටතට ගැනේ (දිසානායක, 2001: 29-30).

තර්ක කිරීම යනු කිසියම් මතයක් ඔප්පු කිරීම සඳහා පරස්පර විරෝධී නොවන ලෙස කරුණු ඉදිරිපත් කිරීම යි. ඒ සඳහා පුද්ගලයා සතුව පවතින උපකරණය වන්නේ තාර්කික චින්තනය යි. තර්ක ශාස්ත්‍රය මෙම නිරවුල් චින්තනයට අවශ්‍ය මූලධර්ම පැහැදිලි කර දෙයි. ඇරිස්ටෝටල්ගේ ඇත්තේ ද්විකෝටික තර්ක ක්‍රමය කි. ඉන්දියාවේ බහුකෝටික තර්ක ක්‍රම හමු වේ. මෙම විවිධ තාර්කික පද්ධති ගණිතමය සිද්ධාන්තයන් ද උපයෝගී කරගෙන තර්කනයේ දී යොදා ගන්නේ කෙසේ ද? යන්න පිළිබඳව තර්ක ශාස්ත්‍රඥයෝ කරුණු විමර්ශනය කරති (Nagel, 1987: 52).

ආචාර විද්‍යාව සෑම දාර්ශනික ඉගැන්වීමක් තුළ ම හමුවන හොඳ නරක පිළිබඳව මිනුම් දණ්ඩක් සමාජය තුළ ඇත්තේ පුද්ගල චර්යාවන් ඇගයීම සඳහා ය. එසේ වෙන් කරන්නේ පෞද්ගලික සිතැඟි අනුවද? නැතිනම් පොදු නිගමන වශයෙන්ද? ආචාරවාදය පිළිගත් මතයක් වන්නේ හොඳ - නරක වර්ග කිරීමට වඩා ආචාරාත්මක ඇගයුම් වන යහපත, අයහපත, යුක්තිය, සාධාරණත්වය, වගකීම, යුතුකම වැනි සංකල්ප විශ්ලේෂණය කිරීම බව ය. මෙහිදී ආචාරවාදියා සදාචාරවාදියාගෙන් වෙනස් වේ. ආචාරවාදියා ඇගයුම් පිළිබඳව පමණක් සොයා බලන අතර සදාචාරවාදියා අදාළ ක්‍රියාව හොඳ හෝ නරක වන්නේ කුමන පදනම් මත දැයි සොයා බලයි.

සෞන්දර්ය විද්‍යාව යනු සුන්දරත්වය පිළිබඳව සිදුකරනු ලබන සංකල්පීය විග්‍රහය යි. සුන්දරත්වය ගැන කරනු ලබන ඇගයුම්ශීලී විනිශ්චයන් ආත්මීය ද වාස්තවික ද යන ගැටලු විමසා බැලීම තවත් අංශය කි. එමෙන්ම සුන්දරත්වය හා බැඳුණු විවිධ අංශ විචාරයට

අවශ්‍ය න්‍යායයන් ද දාර්ශනික වශයෙන් ගොඩනගා ඇත. කලාව කලාව සඳහා ද සමාජය සඳහා ද? වැනි විවාදාපන්න සාකච්ඡා පවා දාර්ශනික ගැටලුවක ස්වභාවය ගනී.

මේ අනුව දර්ශනය නම් විෂයය ගනුදෙනු කරන ක්ෂේත්‍රය පුළුල් පරාසයක් ගන්නා බව පෙනේ. අනිකුත් විද්‍යාවන්ට අයත් වන්නා වූ යම් යම් විෂය කරුණු දර්ශනය තුළ සාකච්ඡා කෙරෙන නමුදු එය දාර්ශනික පසුබිමක් මත සිදු කෙරෙන නිසා එම විෂයයන්ගේ කාර්යභාරය ඉක්මවා යන බව පෙන්වා දිය හැකිය. එනම්, අනෙකුත් විෂයයන් පිළිබඳ දාර්ශනික දෘෂ්ටි කෝණයකින් විග්‍රහ කිරීම දාර්ශනික කාර්යය සේ පෙන්වා දිය හැකිය. මේ අනුව දර්ශනය වනාහි තාර්කික විග්‍රහයේ විධි ක්‍රමය ලෙස හඳුන්වා දීමෙහි කිසිදු වරදක් නැත. මන්ද ප්‍රථම ගණයේ විෂයයන් දෙස බලා ඒවා ගැන විග්‍රහ කිරීම දෙවන ගණයේ විෂයයක් වන දර්ශනයේ කාර්යභාරය ලෙස පිළිගෙන ඇති නිසාවෙනි.

දාර්ශනික ඉතිහාසය ගෙන බලන විට ඇත ග්‍රීක දාර්ශනිකයා අව්‍යාජ දාර්ශනිකයෙකු වූයේ සෑම විද්‍යාවක් පිළිබඳවම පෘථුල අවබෝධයක් ලැබූ නිසාවෙනි. ලෝකය සහ එහි සිදුවන ප්‍රපංචමය ක්‍රියාවලිය තේරුම් ගැනීමට තිබූ එකම විෂය වූයේ දර්ශනය යි. උදාහරණයක් ලෙස ඇරිස්ටෝටල් නම් ශ්‍රේෂ්ඨ ග්‍රීක දාර්ශනිකයාගේ ''ලයිසියම්'' නම් අධ්‍යයන ආයතනය පෙන්වා දිය හැකිය. මෙහි සමාජීය විද්‍යාවන්ට අයත් කරුණු පමණක් නොව ජීව විද්‍යාව, සත්ත්ව විද්‍යාව, භෞතික විද්‍යාව, ගණිතය, වෛද්‍ය විද්‍යාව, උද්භිද විද්‍යාව ආදී ස්වභාවික විද්‍යාවන්ට අයත් විෂයයන් පිළිබඳව ද අධ්‍යයන කෙරුණු බව සඳහන් වේ. එබැවින් ඇත දාර්ශනිකයා වචනයේ පර්සමාප්තාර්ථයෙන් ම අව්‍යාජ දාර්ශනිකයෙකු වූ බව පෙන්වා දිය හැකිය. එසේ හෙයින් සමාජීය හා ස්වභාවික විද්‍යා ලෙස බිහි වී වර්ධනය වී ඇති සෑම විද්‍යාවක ම ප්‍රභවය සනිටුවහන් වන්නේ දර්ශනය තුළය යන්න පිළිගත හැකි කරුණ කි. ඒ අනුව සමාජ දර්ශනයෙහි විෂයාංග සමාජීය විද්‍යා බවට පත් වූ අතර ස්වාභාවික දර්ශනයෙහි විෂයාංග ස්වාභාවික විද්‍යා බවට පරිවර්තනය වූ බව පෙන්වා දිය හැකිය. එබැවින් සෑම විෂයයක ම මාතෘත්වය දර්ශනයට ලබා දිය හැකිය. එම නිසා ''සියලු විද්‍යාවන්ගේ විද්‍යාව දර්ශනය වේ.''

යනුවෙන් ප්‍රස්තුතයක් ද ගොඩ නැංවී ඇත (දිසානායක, 2001: 10). වර්තමානයේ වුවද දර්ශනය මෙම ද්වීතියික කාර්යය වන විග්‍රහය යථා පරිදි ඉටු කරන බව පෙන්වා දිය හැකි ය. උදාහරණ ලෙස දේශපාලන විද්‍යාවේ එන ප්‍රස්තුත හා සංකල්ප විග්‍රහයට භාජනය කරන ලද දර්ශනයෙහි එන උප විෂයයක් ලෙස දේශපාලන දර්ශනය හඳුන්වා දිය හැකිය. එමෙන්ම නීතිය පිළිබඳ විග්‍රහ කරන දර්ශනය නීති දර්ශනය වන අතර ආගම් පිළිබඳ විග්‍රහ කරන දර්ශනය ආගම පිළිබඳ දර්ශනය ලෙස හඳුන්වා දිය හැකිය. අධ්‍යාපනික කාර්යය හා බද්ධ වී ඇති දර්ශනය අධ්‍යාපනික දර්ශනය වශයෙන් හඳුනාගත හැකිය. මෙලෙස අතීතයේ සිට අද දක්වා ම සමාජමය හා පාරිසරික ප්‍රපංච පිළිබඳ තර්කානුකූල විග්‍රහයක දාර්ශනිකයා යෙදී සිටින බව පෙන්වා දිය හැකිය. (දිසානායක, 2001: 21) කාලයාගේ ඇවෑමෙන් දර්ශනයෙහි තවත් උප විෂය ක්ෂේත්‍ර ඒ අනුව බිහි වී තිබෙන බව පෙන්වා දිය හැකිය. විද්‍යාවේ දර්ශනය, සාමය පිළිබඳ දර්ශනය, පාරිසරික දර්ශනය, කාන්තාව පිළිබඳ දර්ශනය, මනස පිළිබඳ දර්ශනය වැනි ක්ෂේත්‍ර උදාහරණ වශයෙන් දැක්විය හැකිය.

## නිගමනය

නූතන විද්‍යාවේ දියුණුවට මෙන් ම එම දියුණුව විසින් ඇති කරන ලද ඇතැම් අනිටු ප්‍රතිඵල ගැන ද අවධානය යොමු කරමින් කටයුතු කරන දාර්ශනික ඥානය ඉටු කරන්නේ ඓතිහාසික කාර්ය භාරයකි. දර්ශනයෙහි සමකාලීන වැදගත්කම හෝ අදාළත්වය ගැන ප්‍රශ්න කරන ඇතැමුන්ට දර්ශනයක් රහිත දැනුම් පද්ධතියක ඇතිවන ගැටලු ඔස්සේ එහි අදාළත්වය පැහැදිලි කළ හැකිය. ක්‍රීඩාව සම්බන්ධයෙන් දර්ශනයක් නොමැති කල විනය විරෝධී ක්‍රියාවන්, පරාජය දරා ගත නොහැකිව සිදුවන ප්‍රචණ්ඩත්වයන් හා තරග පාවාදීම් වැනි ප්‍රවණතා ඇතිවන බව පෙන්වා දිය හැකිය. මෙයින් පැහැදිලි වන්නේ ඕනෑම ක්ෂේත්‍රයක සිටින හා ක්‍රියාත්මක වන පුද්ගලයෙකුගේ දැක්ම හා ඉලක්කය සමෝධානය කරමින් ඒ දක්වා රැගෙන යන චින්තනය එම ක්ෂේත්‍රයට අයත් දර්ශනය වන බව යි. තවද එක් ප්‍රපංචයක් දෙස එක් න්‍යායක් ඔස්සේ අවලෝකනය කිරීම වෙනුවට විවිධ අංශ ඔස්සේ බැලීමට චින්තනය මෙහෙයවන්නේ දර්ශනය යි. මානවයා විසින් වර්ෂ මිලියන ගණනක් තිස්සේ ගොඩනංවන ලද

දැනුම හා චින්තනය අද වනවිට වඩාත් සංවිධානාත්මක දැනුමක් ලෙස විද්‍යාවන් යටතේ ගොනු වී තිබේ. ඒ සෑම විද්‍යාවක්ම ඉගෙනුම ආරම්භ වන්නේ අදාළ විද්‍යාවේ ඉතිහාසය තුළිනි. එහිදී අපට එක් එක් විද්‍යාවන්හි හමුවන දැනුම සොයා යාමේ මාර්ග, පාරභෞතික ප්‍රස්තුත, ආචාරාත්මක බව, තර්කානුකූල බව වැනි පළමු ගණයේ තත්ත්වයන් ගැන සාකච්ඡා කරන්නේ දාර්ශනික ඥානය අදාළ කරගෙනය. ගැටලු විසඳීමෙහි ලා අනුගමනය කළ යුතු තාර්කික ක්‍රියාදාම පෙන්වාදීමට දාර්ශනික ඥානය උපකාරී වන්නේ ය. විශේෂයෙන් ම වර්තමානයෙහි උද්ගත ව ඇති පාරිසරික ගැටලු ගැන විනිවිද දැක්මක් ඇති කර ගැනීමට දාර්ශනික චින්තනය උපයෝගී වී ඇත. එබැවින් මානව ජීවිතය හා සම්බන්ධ සෑම ක්ෂේත්‍රයක ම දැනුම් පද්ධතියෙහි තර්කානුකූල බව ස්ථාපනය කරමින් ඒවායේ පදනම ශක්තිමත් කිරීමට දාර්ශනික චින්තනය අතීතයේ සිට ම කටයුතු කර ඇති බව පැහැදිලි වන්නේය.

## මූලාශ්‍රය නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍රය

*දීඝ නිකාය* - 1, බ්‍රහ්මජාල සූත්‍රය

*සංයුත්ත නිකාය* - 1-8, කරණීය මෙත්ත සූත්‍රය

*සංයුක්ත නිකාය* - 12-15, කච්චායනවච්ඡගොත්ත සූත්‍රය

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ පරිශීලනය කොට ඇත.)

### ද්විතීයික මූලාශ්‍රය

උයන්ගොඩ, ජයදේව. (2010). *සමාජීය - මානවීය විද්‍යා පර්යේෂණ*. සමාජ කොළඹ 7ඃ විද්‍යාඥයන්ගේ සංගමය.

එදිරිසිංහ, දයා. (2008). *දාර්ශනික විමර්ශන*. දෙහිවලඃ වත්මා ප්‍රකාශකයෝ.

කලන්සූරිය, ඒ.ඩී.පී. (1987). *දර්ශනයඃ හැඳින්වීමක්*. වරකාපොලඃ ආරිය ප්‍රකාශකයෝ.

කලන්සූරිය, ඒ.ඩී.පී. (1997). *දාර්ශනික චින්තන ධාරා; ග්‍රීක දාර්ශනිකයෝ*, කොට්ටාවඃ සාර ප්‍රකාශන.

ගුණරත්න, ආර්.ඩී. (2015) *විද්‍යාත්මක ක්‍රමය*. මහනුවර

ඥාණිස්සර හිමි, ඒ. (2005). *භාරත දර්ශන*. කොළඹ 10ඃ ගොඩගේ ප්‍රකාශන.

දිසානායක, අනෝමා. (2001). *දර්ශනය හා දර්ශනයෙහි ස්වභාවය.*

ධර්මසිරි, ගුණපාල. (1978). *දාර්ශනික ප්‍රශ්න.* කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

රසල්, බට්‍රන්ඩ්. (2015). *බටහිර දර්ශන ඉතිහාසය.* කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව: කොළඹ.

රාහුල හිමි, රත්නපුරේ, (2015). *බුදුසමයේ උදාව; ඓතිහාසික පසුබිම*, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

විදානගමගේ, කුලසේන. (1997). *දාර්ශනික ගැටලු* (පළමුවන කාණ්ඩය). නාරම්මල.

හිරියන්න, ඇම්. (2014). *සංක්ෂිප්ත ඉන්දීය දර්ශනය.* බත්තරමුල්ල: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

Jayatilake, K.N. (1963). *Early Buddhist Theory of Knowledge*: George Allen and Unwin Ltd, London

Nagel, T. (1987). *What Does It All Mean? A Very Short Introduction to Philosophy*: Oxford University Press.

Uyangoda, J. (2015). *Social Research. Social Scientists'* Association: Colombo 07.

Wijebandara, C. (1993). *Early Buddhism, its religious and intellectual milieu*: Postgraduate Institute of Pali and Buddhist Studies, University of Kelaniya